M 3

# සාසනාඤ්ජලී

මාතලේ නැගෙනහිර පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක

පූජ්‍ය ඉලුක්කුඹුරේ සාසනරතනාභිධාන

අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය


සංස්කරණය

**අජිත් තල්වත්ත**

**ළිහිණියාගම ධම්මාලෝක හිමි**

ප්‍රකාශනය - දාස්ගිරිය ශ්‍රී සාසනරතන මහ පිරිවෙණ

> මෙහි එන ලිපිවල අයිතිය කතුවරු සතුවන අතර අන්තර්ගතය, පද බෙදීම සහ අක්ෂර වින්‍යාසය යනාදී සියලු කරුණු සම්බන්ධව සංස්කාරකවරු වගකියනු නොලැබේ.

සාසනාඤ්ජලී - මාතලේ නැගෙනහිර පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක පූජ්‍ය ඉළුක්කුඹුරේ සාසනරතනාභිධාන අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය

© අජිත් තල්වත්ත සහ ළිහිණියාගම ධම්මාලෝක හිමි

පළමු මුද්‍රණය - 2019 අප්‍රේල්

ISBN 978-624-5072-00-2

ප්‍රථම මුද්‍රණය - 2019

පරිගණක පිටු සැකසුම - ජී.එච්.ජී. මහේෂිකා මධුභාෂිණී

කවරය නිර්මාණය - ආචාර්ය සුදර්ශන බණ්ඩාර

මුද්‍රණය - ක්‍රියේටිව් ප්‍රින්ටර්ස් ඇන්ඩ් ඩිසයිනර්ස්
නො 159/6/බී, ජයන්ති පාර, උඩුමුල්ල
හල්ලොලුව

ප්‍රකාශනය - දාස්ගිරිය ශ්‍රී සාසනරතන මහ පිරිවෙණ

මහාචාර්ය අලෙක්සැන්ඩර් කපුකොටුව
B.A.(Hons), (SJP), M.Sc. (PGIR) PhD (Gilin University China)
අධ්‍යක්ෂ ජෙනරාල් මධ්‍යම සංස්කෘතික අරමුදල, අංශාධිපති, ඉතිහාසය සහ පුරාවිද්‍යා අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, සභාපති, පුරාවිද්‍යාඥයන්ගේ සභාව.

මහාචාර්ය චන්ද්‍රන රෝහණ විතානාච්චි
B.A. (Hons), (KLN), M.A. (SJP) , PhD (KLN)
පීඨාධිපති, සමාජීය විද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

මහාචාර්ය ඩී. තුසිත මෙන්ඩිස්
B.A.(Hons), (PDN), PGD Dip.(PGIR-KLN) PDG Dip. (PGIAR -KLN) M.Phil (PGIAR-KLN), PhD (PGIAR-KLN)
අංශාධිපති, පුරාවිද්‍යා හා උරුම කලමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා සහ මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

ආචාර්ය රෝහිත දසනායක
B.A.(Hons), M.Sc.(KLN), PhD (Madras)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉතිහාස අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

ආචාර්ය සුදර්ශන බණ්ඩාර
B.A.(Hons), M.Phil.( (PDN), PhD (PGIAR)
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ලලිතකලා අධ්‍යයනාංශය, ශාස්ත්‍ර පීඨය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

ආචාර්ය රාජකීය පණ්ඩිත පනාමුරේ චන්දිම හිමි
B.A.(Hons),M. A.(PDN) PhD (SJP), Royal Pandit (OSS), Japa. Dip (Japan)
ආධුනික කථිකාචාර්ය, බෞද්ධ හා පාලි අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.

ආචාර්ය කුසුමසිරි කොඩිතුවක්කු
B.A. (Hons), M.A. (PDN), PhD (PGIAR-KLN)
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශයේ බාහිර කථිකාචාර්ය, මධ්‍යම සංස්කෘතික අරමුදල, ජේතවන කෞතුකාගාර පාලක:

දොරවක ඇතාබැඳි ලෙන ප්‍රාග් මානව ජනාවාසය
චන්දන රෝහණ විතානාච්චි 121

ප්‍රාග් මහින්ද යුගයේ ලාංකේය සංස්කෘතිය
පූජ්‍ය ළිහිණියාගම ධම්මාලෝක හිමි 135

මිහිඳු මාහිමියන්ගේ ලංකාගමනය හෙවත් මහින්දාගමනය
මහින්ද සෝමතිලක 164

මහායානයේ ආරම්භය හා වර්ධනය පිළිබඳ විමර්ශනයක්
අජිත් තල්වත්ත 193

ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයේ භික්ෂු අධ්‍යාපනය
මාලනී ඇඳගම 210

පාත්‍ර ධාතූන් වහන්සේ පිළිබඳ ඓතිහාසික මතවාද
රෝහිත දසනායක 228

මෙරට බෞද්ධ ආගමික සංකල්පය තුළ පිරිතේ සම්භවය, සම්ප්‍රදාය සහ ආනිශංස
ක්‍රිශාන්ති බණ්ඩාර 239

අනුරාධපුර හා පොළොන්නරු යුගයේ මෙරට ක්‍රියාත්මක වූ අභයදාන සංකල්පය
එම්.ඒ. ප්‍රසාද් කුමාර 250

පැරණි කැටයම් සහ මූර්ති අතර දක්නට ලැබෙන නර්තන රූප .
කේ.එම්. ඇලෙක්සැන්ඩර් කපුකොටුව 260
ජී.කේ. පතිරණ

ජේතවන භූමියෙන් හමුවූ මුද්‍රා හා ඒ ආශ්‍රිත කලාකෘති
ශියාමලී ගුණරත්න 274

බෞද්ධ ගෘහ නිර්මාණ අලංකරණ අංගයක් ලෙස 'වාහල්කඩ'
කේ. එම්. සිරිවර්ධන 288

සීගිරිය ප්‍රදේශයෙන් හමුවූ තාරා ප්‍රතිමා
කුසුම්සිරි කොඩිතුවක්කු 300

පොළොන්නරු යුගයෙහි වූ බුද්ධ ප්‍රතිමා කෙරෙහි බලපැවැත්වූ ඇතැම් සංකල්ප සහ ආභාස
සාලිය කුලරත්න 309

# පැරණි කැටයම් සහ මූර්ති අතර දක්නට ලැබෙන නර්තන රූප

කේ.එම්. ඇලෙක්සැන්ඩර් කපුකොටුව
ජී.කේ. පතිරණ

## ප්‍රවේශය

නර්තනය යනු රිද්මය මඟින් ශික්ෂණ අනුක්‍රමිකව මතු කරන චලන මාර්ගයෙන් කෙනෙකුගේ මනෝභාව ප්‍රකාශ කරන නිවැරදි විධියයි. එය සොභාදහමේ වස්තුන් චලනය වන ආකාරයත් එහි රිද්මයත් මෙන් ම භෞතිකවත් මිනිසා තුළ සිදුවන්නා වූ චලනයත් හා ඊට ම ආවේණික රිද්මයන් විසින් මිනිසා හුරුකර ඇති ආකාරයයි. නර්තනය යන්නට ප්‍රදර්ශනය, ආශ්වාදය පූජාව සඳහා තාලානුරූපව කරන අංග චලනය, නැටිල්ල, විකාර දෙය, විගඩම ආදී අර්ථ රාශියක් ලබා දී ඇත.[1] ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ඉතිහාසය පිළිබඳ කරුණු විමසීමේ දී එය වසර සිය දහස් ගණනක සිට පැවත එන්නට ඇතැයි සිතිය හැකි ය. එනම් ප්‍රාග් ඓතිහාසික යුගය තරම් ඈත කාලයකට මෙම ඉතිහාසය දිව යයි. මුල් ම ජනාවාස වූ ගුහා ආශ්‍රයෙන් මීට හොඳ ම සාධක දැකගත හැකි ය. ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් යැයි සැලකෙන බිල්ලෑව, තන්තිරිමලය ආදී ස්ථානවල ඇති ගුහා සිතුවම් අතර නර්තන විලාශය දක්වන මානව රූප දක්නට ලැබේ.[2] ප්‍රාග් ඓතිහාසික යුගයේ සිට ප්‍රාථමික තත්ත්වයේ පැවති නර්තනය ක්‍රමයෙන් වර්ධනය වී ආර්ය ජනාවාස ව්‍යාප්තිය ආරම්භ සමය වන විට තරමක් වර්ධනීය තත්ත්වයක පවතින්නට ඇතැයි සිතිය හැකි ය. විජය කුමරු එක් දිනක රාත්‍රියේ තූර්ය නාද ශබ්දයක් ඇසී එය

---

1 http://www.divaina.com/2012/10/03badada03.html

2 වළාකුළුආරච්චි, රාණි. ශ්‍රී ලංකාවේ නර්තන කලාවේ ආරම්භය හා වර්ධනය,සංස්කෘතික පුරාණය, 1997,29-30

කවර ශබ්දයක් දැයි කුවේණියගෙන් ඇසූ අතර ඇය පවසා සිටියේ සිරිසවත් පුරයේ සිදු වූ ආවාහ මංගල්‍යයක් අවස්ථාවේ දී පවත්වන නැටුම් ගැයුම් හේතුවෙන් එබඳු ශබ්ද නැගෙන බවයි.[3] පසුකාලීනව රජ වූ පණ්ඩුකාභය රජ දවස ද නර්තනය පැවති බවට සාධක හමු වේ ය. උත්සව දිනවල පණ්ඩුකාභය රජු චිත්තරාජ සමඟ සමාන උස ඇති ආසනයක හිඳගෙන දෙව් මිනිසුන් විසින් පවත්වන ලද නැටුම් බලා ප්‍රීතියෙන් යුක්තව කල් ගෙවූ බව මහාවංසය සඳහන් කරයි[4]. නර්තනයේ විකාශය බොහෝ විට ප්‍රාග් බෞද්ධ ලංකාවේ පැවති විවිධ වූ ඇදහිලි පුද පූජා ඇසුරින් සිදුවන්නට ඇතැයි සිතිය හැකි ය.

## විමර්ශනය

මේ ආකාරයට ශ්‍රී ලංකාවේ නැටුම් කලාව ප්‍රාග් ඓතිහාසික යුගයේ පටන් තිබුණ ද එහි සුවිශේෂී වර්ධනයක් ඇති වූයේ ක්‍රි.පූ 3 වන සියවසේ ලක්දිව බුදුසසුන පිහිටුවීම සමඟ බව සිතිය හැකි ය. දේවානම්පියතිස්ස රජතුමා විසින් නිර්මාණය කරවන ලද ථූපාරාම දාගැබේ නිධන් කිරීමට ධාතූන් වහන්සේ ලා වැඩම වූයේ නැටුම්, ගැයුම්, වැයුම්වලින් අලංකාර වූ පෙරහැරකින් බව මහාවංශය සඳහන් කරයි[5]. දුටුගැමුණු රජතුමා විසින් මහාථූපය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන දිනයේ දී එම භූමියට සැපත් වූයේ ආභරණයන්ගෙන් සැරසී වාද්‍ය භාණ්ඩ අතින්ගත් නළගණින් දහසය දහසක් පිරිවරාගෙන බව මහාවංශයේ මෙන් ම ථූපවංශයේ ද සඳහන් වේ.[6,7] පොළොන්නරු යුගය පමණ වන විට නර්තනය රාජ්‍ය අධ්‍යාපනයේ කොටසක් වී ඇත. රජකුමාරවරුන්ගේ අධ්‍යාපනයට නීති ශාස්ත්‍ර, යුධ සරඹ ආදිය මෙන් ම නෘත්‍ය ගීතාදිය ද අධ්‍යයනය කළ යුතුව තිබී ඇත. මහා පරාක්‍රමබාහු රජු සිය කුමාර කාලයේ දී නැටුම් ගීත ඉගන්ගත් බව මහාවංසයේ සඳහන්

3 මහාවංසය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 2010, සත්වන මුද්‍රණය, පරි. 35.

4 එම, පරි. 45.

5 එම, පරි. 73.

6 එම, පරි. 129.

7 ථූපවංශය, සීමාසහිත ඇම්.ඩී.ගුණසේන සහ සමාගම, කොළඹ, 1989, 179 පිට.

වේ.[8] එපමණක් නොව එතුමන් නර්තනය ආදිය පැවැත්වීමට ගොඩනැගිලි ඉදිකරවා පහසුකම් සලසා තිබේ. මහා පරාක්‍රමබාහු රජතුමා විසින් සිය අගනුවර තුළ නර්තය ආදී කලාවන් ප්‍රගුණ කිරීම සඳහා සරස්වතී මණ්ඩපය නමින් ගොඩනැගිල්ලක් ද ශ්‍රී ලංකාවේ දකුණු ප්‍රදේශයට වන්නට නාට්‍ය ශාලා පහක් ද ඉදිකළ බව මහාවංසයේ සඳහන් වෙයි.[9]

පැරණි ශ්‍රී ලංකාව තුළ නර්තය සමාජයේ වර්ධනීය අංගයක් වශයෙන් පැවති බවට සාධක අභිලේඛන ඔස්සේ ද අනාවරණය වෙයි. ක්‍රි.පූ. 1 වන සියවසේ අවසාන අවධියේ පිහිටවනු ලැබ සැස්සේරුව හා කොරවගල යන ස්ථානයන්ගෙන් ලැබෙන සෙල්ලිපි නිදසුන් වශයෙන් පෙන්වා දිය හැකි ය. එම ලෙන් ලිපිවල නටන ගහපතියා විසින් පවරා දෙන ලදී. සහ නටන ගහපතියාගේ දුව විසින් පවරා දෙන ලදී යනුවෙන් සඳහන්ව තිබේ[10]. මේ තුළින් පෙනී යන්නේ සමාජය තුළ සැලකිය යුතු ආකාරයෙන් නර්තනය කලා අංගයක් වශයෙන් වර්ධනයව පැවති බවයි. මේ ආකාරයට වංශකතාගත සාධක සහ අභිලේඛන මූලාශ්‍රය ඔස්සේ පැරණි ශ්‍රී ලංකාවේ නර්තන කලාව පිළිබඳ ව තොරතුරු අනාවරණය වනා සේ ම පුරාවිද්‍යාත්මක වශයෙන් පැරණි කැටයම්, මූර්ති ඔස්සේ ද මෙරට නැටුම් කලාව පිලිබඳව සාධක බොහෝ හමුවේ. මෙහි දී අනුරාධපුරය යුගයේ සිට මහනුවර යුගය දක්වා හමුවන මෙරට නර්තන කලාවේ ඉතිහාසය පිළිබිඹු කරනු ලබන කැටයම් සහ මූර්ති පිළිබඳ ව තොරතුරු ඉදිරිපත් කිරීම සිදුකරනු ලැබේ.

### නර්තන රූප සහිත කැටයම් සහ මූර්ති

දුටුගැමුණු රජතුමා විසින් ඉදිකරන ලද ලෝවාමහාපායේ කුළුණු හිස් ආශ්‍රයෙන් නර්තනය පිළිබඳ ව සාධක හමු වේ. ලෝවාමහාපයේ කුළුණු හිස් සැරසීමට යොදාගත් වාමන රූප අතර ගායකයන්, බෙරවයන්නන්, නැට්ටුවන්, සක් පිඹින්නන් අන්තර්ගතවේ. ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා විසින් ගණ රූප වශයෙන් සලකනු ලබන මෙම මූර්ති රූප මඟින් විවිධ

8 මහාවංසය, පරි. 278.

9 මහාවංසය, පරි.339.

10 අමරවංශ හිමි, කොත්මලේ. ලක්දිව සෙල්ලිපි, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2014, 81 පිට.

නර්තන අංගහාරයන් ප්‍රකාශයට පත් කරයි[11]. පයක් හා අතක් උස්සා නර්තනයේ යෙදෙන වාමනයාගේ ඇලවුණු හිසින් නර්තනමය ඉරියව් ප්‍රකට වේ. එහි එන තවත් වාමන රූපයක් පලවන්නේ ගමන් තාල යන නැට්ටුවෙකුගේ ස්වරූපයයි. පැත්තකට විසිවන දකුණු අතින් හා වම් උරමත නැගී එන උතුරු සළුවෙන් පලවනුයේ කය ඒ මේ අත පද්දමින් ගමන් කරන ආකාරයයි. එසේ ම වැයමෙන් හිස හා කඳ අඹරවමින් නටන විලාසය ද මේ රූප අතර දක්නට ලැබේ. එහි හිස පිටිපස වමතත්, දකුණු අතෙහි උරහිස හා කයෙහි පිහිටීමත් නිසා වාමනයටෙග් උණුසුම් නැටුම් විලාසයයි. මෙම ඇතැම් වාමන රූප බටනලාව, හක්ගෙඩිය, බෙරය, උඩැක්කිය, තාලම්පට හා බුම්මැඩිය වැනි තූර්ය භාණ්ඩ දරාගෙන සිටින ආකාරයට කැටයම් කර තිබේ. ආචාර්ය චාල්ස් ගොඩකුඹුර මහතා විසින් කුම්භ බෙරය යනුවෙන් බුම්මැඩිය හඳුන්වා ඇති අතර ඇතැමෙක් මෙය කළ ගෙඩි නැටුම නිරූපණය කිරීමක් ලෙස ද දක්වයි[12]. ඒ අනුව කළ ගෙඩිය ක්‍රීඩා භාණ්ඩයක් මෙන් ම තූර්ය භාණ්ඩයක් ලෙස ද භාවිත කරන්නට ඇත. මෙම වාමන රූප විසින් දරා සිටින නර්තන ඉරියව් සහ තූර්ය භාණ්ඩ මඟින් නිරූපණය වන්නේ සමකාලීන අනුරාධපුර යුගයේ ප්‍රකටව පැවති හා නර්තන සහ සංගීත සම්ප්‍රදායන් යැයි උපකල්පනය කළ හැකි ය.

අනුරාධපුරයේ කුට්ටම් පොකුණ අඩිතාලමේ තිබී සොයාගන්නා ලද ක්‍රි.ව 6-7 කාලයට අයත්වනු ලබන ලෝකඩින් කළ තළඟන රූපය ද අනුරාධපුර යුගයේ පැවති නර්තන පිළිබඳ අදහසක් ලබාදීමට සමත්වේ. ඉතා වේගවත් ආකාරයෙන් අත්පා හා හිස චලනය කරමින් ඉදිරිපත් කරනු ලබන නර්තන විලාශයක් මෙම තළඟනගෙන් මූර්තිමත් වේ. භාරතීය සම්ප්‍රදාය තුළ මෙම නර්තන විලාශය ''භ්‍රමරී''නර්තනය ලෙස හඳුන්වනු ලබයි.[13] ඒ

11 විමලවංශ හිමි, බද්දේගම, අපේ සංස්කෘතිය, සමයවර්ධන පොත්හළ, කොළඹ, 2000, 562 පිට.

12 එම, 564 පිට.

13 සංජීව, විනෝද්, පුරාතන දෘශ්‍ය කලා මූලාශ්‍රයන්ගෙන් හෙළිවන ලාංකේය නර්තනය හා වාදනය, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 2006, 50 පිට.

අනුව අනුරාධපුර යුගය තුළ භාරතීය නර්තන සම්ප්‍රදායන්
ආභාසය මෙරට ප්‍රකටව පවතින්නට ඇතැයි අනුමාන ක
හැකි ය.

අනුරාධපුරයේ අභයගිරියෙන් සොයාගන්නා ලද භාරතී
අංග ලක්ෂණ විදහාපාන ක්‍රි.ව 6 වන සියවසට අයත් කුළු
කොටසක ස්ත්‍රීන් දෙදෙනෙක් නර්තනයේ යෙදෙන ආකාර
කැටයම් කර තිබේ. එක් කාන්තාවකගේ අතෙහි උඩැක්කිය
ද අනෙක් අතෙහි රබානක් ද දක්නට ලැබේ. ඔවුන්ගේ උඩුක
නිරුවත් වූ අතර යටිකය සඳහා දෝතියක් ඇඳ තිබේ. එම ඵලකය
ම අත්තාල තබමින් නර්තනයේ යෙදෙන කාන්තාවක් කැටයම් ක
ඇත. මෙම යුගයට ම අයත් නළඟන රූපයක් මිහින්තලේ සිංහ
පොකුණ ආශ්‍රිතව දැකගත හැකි ය.[14] මෙම කැටයම් තුළින් ප්‍රකට
කරවනු ලබන ප්‍රධානත ම කාරණයක් වනුයේ භාරතීය නර්තන
අංගවල ආභාසය අනුරාධුපර යුගයේ නර්තන කලාවට ලැබී
තිබුණු බවයි. ජේතවනාරාම විහාර අංක 02 හි දක්නට ලැබෙන
කුළුණු හිස්වල ද බොරදම් සහිත රූකම්වලට මධ්‍යයෙන් කැටයම්
කර ඇති විවිධ අත් පා චලන සහිත වාමන රූප ආශ්‍රයෙන් ද
නර්තන ලක්ෂණ හඳුනාගත හැකි ය. ඇතැම් වාමන රූප දෙඅත්
බාහුවෙන් ඉහළට කරකවා සිටින ආකාරයක් දක්නට ලැබෙන
අතර ඇතමෙක් එක් අතක් පමණක් චලනය කරමින් නර්තනයේ
යෙදෙයි. එසේ ම ගෙල ද විවිධ ආකාරයෙන් චලනය වී තිබීම තුළ
නර්තනයේ ප්‍රාසාංගිකත්වය පිළිබිඹු වේ. මයුරපාද පිරිවෙණෙහි
නටඹුන් ගල්කණු ආශ්‍රයෙන් ද නර්තනයේ යෙදෙන වාමන රූප
රැසක් දැකගත හැකි ය. විවිධ හැඩතල අනුව යමින් දෙඅත් මනාව
හසුරුවමින් නර්තනයේ යෙදෙන අයුරු මෙම වාමන රූපයන්ගෙ
න් නිරූපිත ය. ඉන වටා බඳ පටියකින් සහ බන්ඩි වළලු වලින්
සමන්විත මෙම වාමන රූපයන්ගෙන් පෙරහැරක් නිරූපණය
වනවා යැයි සිතිය හැකි ය. මෙහි නිරූපිත ඇතැම් වාමනයන්ගේ
අත්හි තීරුවක් වැනි පටියක් දක්නට ලැබේ. එමඟින් පෙරහැරක
ඉදිරියෙන් ගමන් ගන්නා කස කරුවව් සිහිපත් වේ. ඇතැම් විට
එය නර්තය සඳහා යොදාගන්නා යමක් විය හැකි ය.

---

14 සංජීව, 2006, 51 පිට.

මේ ආකාරයේ නිදසුන් විමසා බැලීමෙන් පැහැලිළි වනුයේ ශ්‍රී ලංකාවේ අනුරාධපුර අවධියේ පැවති නර්තන කලාවේ දී ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයේ ම සහභාගීත්වයෙන් වාදනය සංගීත භාණ්ඩ යොදාගනිමින් ක්‍රමවත්ව සිදු වූ ප්‍රාසාංගික අංගයක් වශයෙන් නර්තනය පවතින්නට ඇති බවයි. පොළොන්නරු යුගයේ නර්තන කලාව පිළිබඳ තොරතුරු අනාවරණය කරවනු ලබන කැටයම් සහ මූර්ති අතර පොළොන්නරුව අංක 02 දරණ ශිව දේවාලයෙන් හමු වී ඇති දැනට කොළඹ කෞතුකාගාරයේ තැන්පත් කර ඇති කැටයම් පුවරුව ඉතා අලංකාර මෙන් ම වැදගත් නිර්මාණයකි. මෙම පුවරුවේ නර්තනයේ යෙදෙන පිරිමි රූප දෙකක් කාන්තා රූපයක් සහ බෙරයක් වාදනය කරන පිරිමි රූපයක් දක්නට ලැබේ. මොවුන්ගේ ඇඳුම් පැළඳුම් විසිතුරුව දක්වා තිබේ. මොවුන් සෑම දෙනා ම හොඳින් පාත් වී දෙපසට පැද්දෙන ආකාරයේ ඉරියව්වක් ප්‍රකට කරයි. බෙර වයන්නා ද නටමින් බෙරය වාදනය කරන ආකාරයක් දැකිය හැකි ය. එක් පිරිමි නර්තකයෙකුගේ දෙපස වාමනයන් දෙදෙනෙකු නර්තනයේ යෙදෙනු දක්නට හැකි ය. මෙය සමකාලීන නර්තනයේ ස්වභාවය හැදෑරීම පිණිස උපකාරීවන හොඳම නිදර්ශනයක් වශයෙන් පෙන්වාදිය හැකි ය[15].


12වන සියවසට අයත් දැදිගමින් හමුවන ඇත් පහණ ආශ්‍රිතව ද නර්තන වාදන රූප කිහිපයක් දැකගත හැකි ය. පහන එල්ලා තැබීම සඳහා යොදන ලද දම්වැලෙහි සමාන පරතරයෙන් සිටින මානව රූප තුනක් දැකගත හැකි ය. දම් වැලෙහි මුලින් ම තිබෙන්නේ සෙ.මී. 7.5 ක් පමණ උස් වූ නාට්‍යාංගනාවගේ රූපයයි. ඇයගේ වමත ගජහස්ත මුද්‍රවෙන් ද දකුණත කටක හස්ත මුද්‍රවෙන් ද සමන්විත වේ. ඇයගේ දෙකකුල් දණහිස ළඟින් නැමී තිබේ. වම් පාදයේ විලුඹ පොලවට තරමක් ඉහළින් පිහිටුවීම තුළ නාට්‍යාංගනාවගේ චලන රිද්මය පෙන්නුම් කරනු ලබයි. නළඟන රූපයෙන් පසුව සිටින්නේ පුරුෂයෙකි. ඔහු තාලම්පටයක් වාදනය කරන ආකාරයක් නිරූපණය කරයි. ඉන්පසුව සිටින්නේ ද තවත් පුරුෂයෙකි. ඔහු වම් උරහිසින් එල්ලා ගත් බෙරයක් වාදනය කරන ආකාරය හඟවයි. තාලම්පොට වයන්නා සහ බෙර වයන්නා

15 කැකුලන්දල, කෝෂලී, පැරණි ලක්දිව නර්තන කලාව, සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජා ඇළ, 2014, 96 පිට.

යන දෙදෙනා ම නාට්‍යාංගනාව මෙන් කකුල් දණ හිස ළඟින් නැමී වම් විලුඹ පොලොවෙන් ඉස්සී තිබෙන ඉරියව්වකින් සිටී. ඒ අනුව ඔවුන් දෙදෙනා ද නාට්‍යාංගනාව සමඟ ඇයට අනුරූපව පාද තබමින් ගමන් ආකාරයක් හඳුනාගත හැකි ය. (ඡායාරූප 01,02)



ඡායාරූප 01 - දැදිගම ඇත්පහන



ඡායාරූප 02 - දැදිගම ඇත්පහනෙහි දක්නට ලැබෙන නර්තන සහ වාදන රූපවල දළ සටහනක්

භාරතීය නර්තනයේ ආභාසය මෙරටට තදින් ම බලපෑ යුගය වශයෙන් පොළොන්නරු යුගය හඳුනාගත හැකි ය. හින්දු ආගම බලපෑමේ ප්‍රතිඵලයක් වශයෙන් පොළොන්නරු යුගයේ දී හින්දු කෝවිල් ඉදිවීම ආරම්භ වේ. හින්දු සම්ප්‍රදායන් කෝවිල් ආශ්‍රිතව නැටුම්, ගැයුම්, මූලික කරගත් පූජාවන්ට විශේෂ තැනක් හිමි වේ. මේ හේතුවෙන් එකී ආභාසය පොළොන්නරු යුගයේ දී මෙරට නර්තන කලාවට ලැබෙන්නට ඇතැයි සිතිය හැකි ය. හින්දු ආගමට හා දර්ශනයට අනුව නර්තනයට අධිපති ලෙස සලකන්නේ ශිව දෙවියන් ය. නටරාජා වශයෙන් නිරූපණය කරනු ලබන්නේ නර්තනයට අධිපති ශිව දෙවියන් ය. නටරාජා නිරූපනය කරනු ලබන ප්‍රතිමා ගණනාවක් ම පොළොන්නරු යුගය තුළින් හමු වේ.

දැනට ලැබී ඇති විශාලම ලෝකඩින් කල නටරාජා රූපය පොළොන්නරුව ශිව දේවාල අංක 02න් සොයාගෙන තිබේ. අඩි 4 අඟල් 3/4 ක් පමණ උස ප්‍රතිමවක් වන මෙය ක්‍රි.ව 11වන සියවසට අයත් යැයි සැලකේ. කවාකාර ප්‍රභාමණ්ඩලයක් මැද පද්මාසනයක් මත හිඳින ආකාරයට නිර්මාණය කර ඇති නටරාජා රූපය ඉදිරියේ සංගීත කණ්ඩායමක් නිරූපණය කර ඇත. එහි දකුණේ සිට වමට තාලම් වයන ස්ත්‍රියක් සහ පුරුෂයෙක් දැක්වේ.[16] (ඡායාරූප 03)



ඡායාරූප 03 - ලෝකඩ නටරාජා රූපය

16 කැකුලන්දල, 2014, 101 පිට.

ක්‍රි.ව. 12 වන සියවසට අයත් සේ සැලකෙන පොළොන්නරුව අංක 05 ශිව දේවාලයෙන් සොයාගන්නා ලද නටරාජ ප්‍රතිමාව සෙ.මී. 90 පමණ උසින් යුක්ත වේ. ශිව නටරාජාගේ නෘත්‍ය ඉරියව්ව හොඳින් ම නිරූපණය කර ඇති මෙම ප්‍රතිමාව වෘත්තාකාර ප්‍රභා මණ්ඩලයක් මැද නිර්මාණය කර තිබේ. හිස සහ දකුණු පාදය ප්‍රභා මණ්ඩලයට සම්බන්ධ කර ඇත. කොණ්ඩය නර්තනයේ දී විහිදෙන ස්වභාවයක් දක්වයි.[17] පොළොන්නරුවෙන් සොයාගන්නා ලද 12 වන සියවසට අයත් තවත් නළඟනකගේ රූපයක් වේ. මෙම රූපයේ දෙපා සහ අත් පිහිටා තිබෙන ආකාරය අනුව භරත නර්තනාංගනයක යෙදී සිටින බව හඳුනාගත හැකි ය. දෙපා තබාගෙන සිටින්නේ අරමණ්ඩය යනුවෙන් හඳුන්වන භරත නැටුමේ මූලික ඉරියව් අනුව ය. ඇගේ යටිකය දණහිසට උඩින් වන කෙටි දෝතියකින් සමන්විත වේ. උඩුකය නග්න ය. වළලු, බාහු වළලු, කරමාල, ඉන පළඳනා සහ නූපුරවලින් අලංකාර කර තිබේ. පොළොන්නරු යුගය වන විට දකුණු ඉන්දිය නර්තන කලාවන්ගේ ආභාසය මෙරටට ලැබී තිබුණු බවට මෙම මූර්තිය ඔස්සේ පැහැදිලිව ම හඳුනාගත හැකි ය.

මෙරට නර්තන ඉතිහාසය පිළිබඳ කරුණු අධ්‍යයනයේ දී යාපහුව සෝපානය ආශ්‍රිතව දක්නට ලැබෙන කැටයම් සහ මූර්ති අතිශයින් වැදගත් ය. සෝපානයේ විවිධ ස්ථානයන්හි කැටයම් කරන රූප අතර නළඟනන් මෙන් ම වාදකයන් ද දැකිය හැකි ය. මෙම ස්ථානයේ කැටයම්වල ඇති සුවිශේෂීත්වය වන්නේ ඒ තුළින් විවිධ නර්තන වාදන ඉරියව් ඉදිරිපත් කිරීමයි. එහි එන රූකමක මිනිසෙක් තම දෑත් බිමට තබාගෙන සිටගෙන දෙපා ඉහළට ඔසවා සිටින අතර බෙර වයන්නෙකු වාදනය කරනපදයට අනුගතව චලනය සිදුකරන අයුරු දැක් වේ. තවත් ස්ථානයක නැට්ටුවා හා වාදකයා යන දෙදෙනා ම එක් පාදයක් තම හිසට ඉහළින් ඔසවා සිටින ආකාරයේ අසීරු ඉරියව්වක නිරතව සිටී. මේ පිළිබඳ අදහස් දක්වනු ලබන විද්වතුන් ප්‍රකාශ කර සිටින්නේ භරත නාට්‍යම්වල අන්තර්ගතවන අංග 108 න් එක් ඉරියව්වක් මේ තුළින් නිරූපණය කර ඇති බවයි. (ඡායාරූප 04, 05)

---

17 කැකුලන්දල, 2014, 102 පිට.

හා නර්තන අශ්‍රිත විවිධ අංග ප්‍රකට කරවන රූ කම් ගණනාවක් දැකිය හැකි ය. දේවාලයට ඇතුළුවන ස්ථානයේ ද පිහිටි ප්‍රධාන බාල්කය මත පැරණි ජන නැටුමක් වූ ලී කෙළි නැටුම පෙන්නුම් කරන කැටයමකි. දෑතට ගන්නා ලද ලී සහිතව නර්තනයේ එක් ඉරියව්වක් ප්‍රකට කරවන ආකාරයට කැටයම නිර්මාණය කර තිබේ. ඇම්බැක්ක කැටයම් අතර දක්නට ලැබෙන නළඟන රූපය ද මෙම යුගයේ වර්ධනය පැවති නර්තන සම්ප්‍රදායක් පිළිබඳ ව අනාවරණය කරයි. නාට්‍යංගනාව දණහිසින් නැමී වම් අත වම් දණ හිස මත තබා දකුණතින් ඉන්දිය නර්තන ශෛලියක හස්ත මුද්‍රවක් දක්වමින් සිටී. භාරත නාට්‍ය පාද ප්‍රයෝගවලින් යුත් අංග ප්‍රත්‍යංග මෙරට නර්තනයට මිශ්‍රව පැවති බවට මෙම නළඟන රූපය පැහැදිලිව ම සාධක සපයයි. එසේ ම මෙම කැටයම් අතර දක්නට ලැබෙන රබන් වයන්නාගේ කැටයම තුළින් රබන් තාල අනුව සිදුකරන රංගනයක් නිරූපණය කරයි. (ඡායාරූප 06)



ඡායාරූප 06 - නළඟන රූපය - ඇම්බැක්ක දේවාලය


ගඩලාදෙණිය විහාරයට ඇතුළුවන ස්ථානයේ ද නළඟනක්, බෙරකරුවන්, නල සහ උඩැක්කි වාදනය කරන්නන් කැටයම් කර තිබේ. වයන්නන් විසින් සපයනු ලබන වාදනයට අනුව නාට්‍යංගනාව තාලයට අත පා හසුරවමින් නර්තය සිදුකරන ආකාරය මෙම කැටයමේ පැහැදිලිව ම හඳුනාගත හැකි ය. (ඡායාරූප 07)



ඡායාරූප 07 - නාට්‍යාංගනාව සහ වාදකයෝ ගඩලාදෙණිය විහාරය

ගම්පොල යුගයට අයත් බුලත්කොහුපිටිය ගණේගොඩ පුරාණ විහාරයේ නර්තන කලාවට සම්බන්ධ රූකම් රැසක් ද දැක ගැනීමට හැකි ය. ඒ අතරින් හේවිසි මණ්ඩපයේ කැටයම් අතර වන නර්තන රූප එකොළහ වැදගත් වේ. මෙම රූප පෙල මධ්‍යයේ නර්තකයින් තිදෙනෙකුගෙන් යුත් ඝටයක් වන අතර ඒ දෙපස සිටින නර්තන ශිල්පිනියන්ගේ හස්ත පාද දෙපසට චලනය කිරීමේ අවස්ථාවක් නිරූපනය කරන බව කකුල් අතරින් පෙනෙන දිගු නරුපට චලනය වන ස්වරූපය අනුව නිගමනය කළහැකි ය. ඝටයට දකුණු පසින් හා වම් පසින් වන රූකම් හතර නරු සහිත රංග වස්ත්‍රයෙන් සැරසී සිටින අතර ඔවුන දෑතින් යම් රංග භාණ්ඩයක් දරා සිටින ආකාරයක් වේ. මොවුන්ගේ අඟපසඟ ද වඩාත් උචිත ආකාරයෙන් දක්වා තිබේ. උඩුකය නග්න මෙම රූකම් යටිකය කෙටි වස්ත්‍රයකින් සරසා තිබේ. කාන්තා රූප වල හිස පසෙකින් කොණ්ඩ ගුලියක් ගසා හිස සරසා ඇති අතර පිරිමි රූප ශීර්ෂාභරණ සහිත ව දක්වා තිබේ. මෙහි වන රූකම් අතර මෘදංගය වැනි වාද්‍ය භාණ්ඩයක් ඉණ දරන්නන්ගෙන්, දකුණුපස රුව අරමණ්ඩියේ පිහිටා සිටින අතර වම් පස ශිල්පියා මණ්ඩියත් අරමණ්ඩියත් නො වන ඉරියව්වක වේ. අනෙක් වාදන ශිල්පීන් දෙදෙනා, ඩමරුව විය හැකි උඩැක්කිය ආකාරයේ වාද්‍ය භාණ්ඩයක් වාදනය කරමින් තමා ළඟ සිටින වාදන ශිල්පියා සමඟ සංවාදාත්මකව වාදනයේ යෙදෙන බව පසක්වේ. (ඡායාරූප 08,

09) මෙමඟින් නර්තන කලාව හා සම්බන්ධ භාරතීය ආභාස
පිළිබඳ බොහෝ තොරතුරු අනාවරණය වන බව නිගමනය වේ



ඡායාරූප 08 - වාදකයෝ -ගණේගොඩ පුරාණ විහාරය



ඡායාරූප 09 - නාට්‍යාංගනාව -ගණේගොඩ පුරාණ විහාරය

ව භාරතීය ආභාසය
ත බව නිගමනය වේ.



ණ විහාරය



ණ විහාරය



පනාවිටිය අම්බලමේ සුප්‍රසිද්ධ දැව කැටයම් අතර ද නර්තන සහ වාදන රූප කිහිපයක් ම දැකිය හැකි ය. ඒ අතර නළඟන කැටයම වැදගත් ය. එක් අතක් පහතට දමා නෙරිය අල්ලා ගනිමින් ද අනෙක් අතින් තම ඇඳිවත ඉහළට අල්ලා නර්තන විලාසයක් දක්වයි. එසේ ම මෙහි කැටයම් කර ඇති වෙස් නැට්ටුවාගේ රූපය ද මහනුවර සමයේ නර්තනයේ ස්වභාවය මූර්තිමත් කරයි. වෙස් නැට්ටුවා මණ්ඩියට පහත් වී දෑත් කලා මත තබාගෙන නැටුමේ නිශ්චල බව ප්‍රකාශ කරයි. මෙම කැටයම මඟින් වර්තමානයේ උඩරට කංකාරි නටන ශිල්පියාගේ ඇඳුම් කට්ටලය නිරූපනය යේ. පායිම්පත, බණ්ඩි වළලු, සිබාබන්ධනය, නෙත්ති මාලය, ඉන හැඩය, තෝඩුපත්, ඉන පටිය, කර පටිය, හඟල, අවුල්හරය, උල්ලූඩය, තරු ආදී අංග ගණනාවක් ම මෙම කැටයම තුළ දැකිය හැකි ය.

## සමාලෝචනය

මේ ආකාරයට විමසා බැලීමේ දී පැහැදිළිවනුයේ නර්තන ශ්‍රී ලංකාව තුළ ඈත අතීතයේ පටන් ම ස්ථාපනය වී පැවති කලාංගයක් වශයෙන් පැවතී ඇති බවයි. ප්‍රාග් බෞද්ධ යුගයේ දී පවා නර්තනය මෙරට සමාජයේ ජනගතව පැවතී ඇති අතර බුදුදහම පැමිණීමත් සමඟ එයට නව මුහුණුවරක් ආදේශ වී තිබේ. සාහිත්‍ය මූලාශ්‍රයන්හි නර්තනය පිළිබඳ අන්තර්ගත තොරතුරු තහවුරු කරන අන්දමේ සාධක පුරාවිද්‍යාත්මක වශයෙන් ද කැටයම් සහ මූර්ති තුළින් අනාවරණය වී ඇත. නර්තනය පිළිබඳ මූලාශ්‍ර සපයනු ලබන පැරණි රූකම් සහ මූර්ති විමසීමේ දී පැහැදිළි වන ප්‍රධාන ම කරුණ වන්නේ දේශීය වශයෙන් වර්ධනය වී තිබූ නර්තන කලාවට භාරතීය ආභාසය ද ලැබී තිබුණු බවයි. ඒ ඒ යුගය තුළ පැවති දේශපාලනික පසුබිම් මත එකී භාරතීය ආභාසය අඩු වැඩි වශයෙන් මෙරට නර්තන කලාවට බලපා තිබේ.